Q

විදේශ ගමන් බලපත්රය සහ නේවාසික කාඩ්පත අනිවාර්යයෙන්ම ළඟ තබා ගත යුතු ද?




A

නිවසෙන් පිටතට යන විට, විදේශ ගමන් බලපත්රය හෝ නේවාසික කාඩ්පත අනිවාර්යයෙන්ම රැගෙන යන්න. මෙය ජපානයේ නීතියෙන් තීරණය වී ඇත. පොලිස් නිලධාරියෙකු විසින් විදේශ ගමන් බලපත්රය හෝ නේවාසික කාඩ්පත "මිසෙතෙ" (පෙන්වන්න) ලෙස පැවසුව හොත්, අනිවාර්යයෙන්ම එය එම පොලිස් නිලධාරියාට පෙන්වන්න.

ඔබ, ජපානයේ රැඳී සිටීමේ තත්ත්වය (status of residence) මගින් අවසර දී නොමැති කටයුතු කිරීම හෝ රැඳී සිටිය හැකි කාලය ඉක්මවා ජපානයේ

Q

භූමිකම්පා හෝ ආපදාවක දී කුමක් කල යුතු ද?



A

රූපවාහිනි හෝ රේඩියෝ මගින් භූමිකම්පා හෝ ආපදා නිවේදනවලට හොඳින් සවන් දෙන්න.
සන්සුන්ව ක්රියා කරමු.
පලායාමට සූදානම් වෙමු

පොලිසිය, නගර/ කොට්ඨාශ/ ගම් සභාවේ කාර්ය මණ්ඩලය පවසන දෑ හොඳින් අසා, "හිනං" (ආරක්ෂිත තැනකට යන්න) හෝ "නිගෙතෙ" (පලායන්න) ලෙස පැවසූ විට, පවසන පරිදි පලායමු.

දුම්රිය තුල දී, අනිවාර්යයෙන්ම දුම්රිය පාලක මහතුන් පවසන දෑ හොඳින් අසා, පවසන පරිදි පලායමු.

විශාල භූමිකම්පාවක දී, අනතුරුදායක බැවින්, මෝටර් රථ හෝ මෝටර් බයිසිකල් භාවිතා නොකළ යුත්තේය.

# බියෙන් සැකෙන් තොරව ආරක්ෂිතව

# Q & A

~ බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට ~



වෙබ් අඩවිය

පොලිස් දෙපාර්තමේන්තුව

සිංහල
シンハラ語

街とともに。人とともに。
FOR MORE COMMUNICATION
けいしちょう

リサイクル適性Ⓐ この印刷物は、印刷用の紙へリサイクルできます。

**Q** ගැටළුවක් ඇති වූ විට ඇමතිය යුතු ස්ථාන කුමක් ද?




**A** ගැටළුවක් ඇති විට ඇමතුමක් ලබා දෙන්න.

හදිසි අවස්ථාවක

යම් සිදුවීමක් / අනතුරක් සිදු වූ විට

පොලිසිය “110”

වෙත ඇමතුමක් ලබා දෙන්න.

ගින්නක් / අසනීපයක් / තුවාල වීමක් ඇති වූ විට

ගිනි නිවීමේ ඒකකය “119”

වෙත ඇමතුමක් ලබා දෙන්න.

**Q** “කෝසත්සු” (පොලිසිය) සමඟ සම්බන්ධ වන්නේ කෙසේ ද?




**A** මාර්ග අනතුරක්, අපරාධයක් සිදු වූ විට,

පොලිසිය “110”

වෙත ඇමතුමක් ලබා දෙන්න.

ඔබට ජපන් භාෂාව නොතේරෙයි නම්,

පරිවර්තකයෙකු ඔබට සවන් දෙනු ඇත.

තවද,

තමන්ගේ දෙයක් නැති වූ විට

වෙනත් කෙනෙකුගේ දෙයක් ඇහිඳ ගත් විට

පොලිසියක් හෝ පොලිස් මුරපොලක් වෙත

යන්න

පොලිස් උපදේශන මධ්‍යස්ථානය

“# 9110”

මගින් උපදේශනයේ අන්තර්ගතයට අනුව, උපදෙස් ලබා

ගත යුතු ස්ථානය පැහැදිලි කෙරේ.

**Q** කරුණාකර ජපානයේ මාර්ග නීති කියා දෙන්න.




**A** ජපානයේ මාර්ග නීති

ඇවිදින විට කරුණාකර මාර්ගයේ

දකුණු පසින් ඇවිදින්න. බයිසිකල් සහ

වාහන මාර්ගයේ වම් පසින් ධාවනය කෙරේ.

ඇවිද යන අයගේ ආරක්ෂාව වඩාත්ම වැදගත් වේ.

ඇවිදින විට පදිකවේදිකාව භාවිතා කරන්න. පාර

මාරුවන විට කරුණාකර පදික මාරුව භාවිතාකරන්න.

මාර්ගයේ (පදික වේදිකාව නොව) වම් පසින් පාපැදි

ධාවනය කරන්න. හරස් අතට පෙළගැසී පාපැදි

ධාවනය කිරීම සිදු නොකළ යුත්තේය.

අනිවාර්යයෙන්ම ආලෝක සංඥාවලට අවනතවන්න.

මත්පැන් පානය කල පසු, රථවාහන ධාවනය

නොකළ යුත්තේය. මත්පැන් පානය කල පසු,

කරුණාකර පාපැදි ධාවනය ද සිදු නොකරන්න.

ආරක්ෂිතව හා බියෙන් සැකෙන් තොරව මාර්ග

භාවිතා කිරීම සඳහා නීති සහ ආචාරධර්මපිළිපදින්න.